ක්‍රියාකාරකම:5

ශ්‍රේණිය: 7

වාරය: III

නිපුණතා මට්ටම (3.3.1) : වර්ණ ප්‍රභේද භාවිතයෙන් සැරසිලි නිර්මාණය කරයි.


ක්‍රියාකාරකම: ආදර්ශ ලියුම් රඳවනයක් සාදමු.

අවශ්‍ය සම්පත්: කතුර, කඩදාසි, පාට කඩ්බෝඩ්, වර්ණ නූල් ( කඩදසි, කාඩ්බෝඩ් ඉවතලන දේවල් වීම වඩා සුදුසුයි.

පහත සඳහන් උපදෙස් කියවා තේරුම් ගෙන නිර්මාණය කිරීමට උත්සහ කරන්න.

- ඔබට ලැබී ඇති හෝ සපයාගත් බෝඩ් භාවිතා කර අඟල් 8×12 ප්‍රමාණයේ හා 8×8 ප්‍රමාණයේ කොටස් දෙකක් කපා ගන්න. (1  සහ 2 රූප සටහන්)
- අඟල් 12×8 කොටසෙහි අඟල් 8 පළල එක් කොටසක මුලු ඩෙක 3 රූප සටහනේ පරිදි සමමිතික ව වක්‍රාකාර හැඩයට කපා ගන්න. එහිදී අඟල් 12 දිග කොටසේ දෙපැත්තේ ඉහළ සිට පහළට අඟල් 2ක උසක් ලකුණු කර ගෙන සමමිතික බව රැකෙන පරිදි වක්‍රාකාර හැඩ ඇඳ ගන්න.
- එක ම වර්ණයෙ ප්‍රභේද ඔබට කැමති අයුරින් භාවිතා කර අඟල් 8×12 ප්‍රමාණයේ කොටස වර්ණ ගන්වන්න. (වියුක්ත හැඩ, මල කොළ ආදී ඕනෑම  හැඩයක් භාවිතා කළ හැකි ය.)
- ශීත වර්ණ හා උෂ්ණ වර්ණ භාවිතා කර 8×8 ප්‍රමාණයේ කොටස වාර්ණ ගන්වා ගන්න.
- අඟල් 8×8 ප්‍රමාණ කොටසෙහි පිටත සිට ඇතුළට අඟලක ප්‍රමණයක් සිටින සේ අඟල් 6×7 ප්‍රමාණයක් කොටුවක් ලකුණු කර 4 රූප සටහනේ ආකාරය මිනුම් ලකුණු කර ගන්න. ඉන් පසුව කඩ ඉරි දිගේ නැමි යොදා අඳුරු කර ඇති සියලු කොටස් කපා ඉවත් කරන්න. (රූප සටහනේ දක්වා ඇති මිනුම් පිළිබඳ සැලකිලිමත්වන්න.)
- 5 රූප සටහන අනුව අඟල් 8×12 කොටසේ දෙපැත්තෙන් සහ පහළින් අඟලක ප්‍රමාණයක් පිටතට සියින සේ අඟල් 6×7 ප්‍රමාණයේ කොටුවක් ලකුණු කරන්න.
- ලකුණු කරගත් කොටුවේහි බාහිර රේඛාවේ තද පැහැයෙන් ලකුණු කර ඇති කොටස්වලට පිහි තලයක් අධාරයෙන් කැපුම් යොදන්න. (නිවැරදි මිනිම් අනුව කැපුම් යෙදීමට සැලකිලිමත්වන්න.)
- අඟල් 8×8 කොටසෙහි පිටතට නෙරන සේ කපා ගත් ත්‍රිකෝණාකාර කොටස්කඩ ඉරි දිගේ වර්ණ නොකළ පැත්තට නම, පොකැට්ටුවක් ආකාරයට නැමි යොදා සකස් කර ගන්න. (6 රූප සටහන)

- සකස් කර ගත් පොකැට්ටුව අඟල් 8×12 කොටසේ කැපුම් යෙදූ තැන්වලට ගැළපෙන සේ ඇතුළට යොදා පිට ඇත්තෙන් අලවා ගන්න. ( 7 රූප සටහන)




- නිමකළ නිර්මාණය බිත්තියේ එල්ල තැබිය හැකිවන සේ ඉහළ කවාකාර කොටස මැදින් සිදුරක් යොදා ගන්න.

(උපදෙස් හා රූප සටහන් ගුරු අත් පොතෙන් උපුටා ගන්න ලදී.)

ඩී.කේ.දිලානි අලුත්ගෙදර - ර/ හෝප්වෙල් විද්‍යාලය